ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. CSS/7/1/1/1/2013 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015.06. 26 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02/2015

දකුණු පළාත් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ,

හා ගණන් දීමේ නිලධාරීන් වෙත.

## පළාත් සභා ආයතන විගණනයට විගණකාධිපතිවරයාට ඇති බලතල

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව මගින් සියළුම රාජ්‍ය ආයතන විගණකාධිපතිවරයාගේ විගණනයට ලක්වන අතර ,ඒ සඳහා විගණකාධිපතිවරයාට සහ ඔහුගේ කාර්යමණ්ඩලයට අවශ්‍ය බලතල ලබා දී ඇත. එසේම 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 වන වගන්තිය මගින් පහත පරිදි විගණකාධිපතිවරයාගේ විගණනය පළාත් සභාවට බලාත්මක කර ඇත.

1987 අංක 42 දරණ පළාත් සභා පනත

**(23) (1) පළාතක පළාත් සභා අරමුදල විගණනය කිරීම සහ එහි ගිණුම් සම්බන්ධයෙන් , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ වන්නේය.**

**(2) පළාතක පළාත් සභා අරමුදලේ ගිණුම් හා සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඔහු විසින් එය පළාත් සභාව ඉදිරියේ තැබීමට සැලැස්විය යුතුය.**

තවද , මුදල් රෙගුලාසි 154 යටතේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව උපුටා දක්වමින් රජයේ ආයතන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය හා බලතල පිළිබඳව මෙසේ සඳහන් කර ඇත.

154. (1) විගණකාධිපතිවරයා විසින් රජයේ සියලුම දෙපාර්තමේන්තුවල ගිණුම් ද , අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ , අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ , රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ , පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ , පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ හා මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පළාත් පාලන ආයතන කාර්යාලවල සහ රාජ්‍ය සංස්ථා කාර්යාලවල ගිණුම්ද කිසියම් ලිඛිත නීතියක් යටතේ රජයට පැවරී ඇති වෙළෙඳ ව්‍යාපාරවල හෝ වෙනත් ව්‍යාපාරවල ගිණුම් ද විගණනය කළ යුත්තේ ය.

154. (3) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලබන්නා වූ කාර්ය සහ කර්තව්‍ය ද විගණකාධිපතිවරයා විසින් ඉටු කළ යුත්තේය.

154. (5) (අ) විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තෙකුට තම කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී -

(i) සියලු පොත්පත් ,වාර්තා , වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමේ ද

(ii) ගබඩා හා වෙනත් දේපළවලට පිවිසීමේ ද

(iii) එකී කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු ලබා ගැනීමේද, කරුණු පැහැදිලි කරවා ගැනීමේ ද හිමිකම ඇත්තේය.

154. (6) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තමන්ට අයත් කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස දහයක් ඇතුළත දී සහ අවශ්‍ය යැයි ඔහු සලකන කවර වූ හෝ අවස්ථාවක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

විගණකාධිපතිවරයාට ද ඔහු විසින් ලිඛිතව බලය දී ඇති නිලධාරීන්ටද ස්වකීය කාර්ය හා කර්තව්‍යය ඉටුකිරීම සඳහා සෑම සහයෝගයක්ම දක්වන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ ගණන් දීමේ නිලධාරීන් සහතික විය යුතුය.

දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 104 මගින් ද විගණකාධිපතිවරයාගේ විගණනය පිළිබඳව උපදේශ ලබා දී ඇත.

මෙසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රජයේ මුදල් රෙගුලාසි හා දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය මගින් විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍ය සහ බලතල පැහැදිලිව සඳහන් කර තිබියදීත් , මෙම පළාත් සභාවේ සමහර ආයතන විගණනය කිරීමේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය සහාය ප්‍රමාණවත්ව නොලැබෙන බවත් , විගණනයට බාධාවන ගැටළුකාරී අවස්ථාවන්ට මුහුණ දීමට සිදුවන බවත් වාර්තා වී ඇත.එය ඉතාමත් අයහපත් තත්වයකි. එබැවින් මින් ඉදිරියට එවැනි තත්වයන් ඇති නොවන සේ කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසත් , විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට

විගණනයට අවශ්‍ය සහාය උපරිම වශයෙන් ලබාදෙන ලෙසත් හා ඒ පිළිබඳව ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ ඇති සියලු ආයතනවල නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි. එමෙන්ම විගණනයට අවශ්‍ය සහාය ලබා නොදෙන හා බාධාකාරී ලෙස කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බවත් කාරුණිකව දැනුම් දෙමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :-

1. සහකාර විගණකාධිපති - දකුණු පළාත - දැ.ගැ.ස.
2. ආණ්ඩුකාර ලේකම් - ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.
3. සභා ලේකම් - දකුණු පළාත් සභාව - දැ.ගැ.ස.
4. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.